# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

# දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2023**

**2026 ජනවාරි/පෙබරවාරි**

**මානවශාස්ත්‍ර පීඨය**

## බෞද්ධ සංස්කෘතිය

**(නව නිර්දේශය)**

**ආගම් පිළිබඳ තුලනාත්මක අධ්‍යයනය හා බෞද්ධ සම්ප්‍රදායන්**

## BUCU 38224

එක් කොටසකින් ප්‍රශ්න එකක්වත් ඇතුළත් වන සේ ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

### I කොටස

01. 'ආගම' යන්න නිර්වචනය කොට එහි සම්භවය පිළිබඳ විද්වත් මත සමාලෝචනය කරන්න.

02. හින්දු දහමට අදාළ දේව සංකල්පයේ මූලික ස්වරූපය සාකච්ඡා කොට හින්දු ආගමික උත්සව එම සංකල්පය හා කෙසේ සම්බන්ධ වන්නේදැයි විමර්ශනය කරන්න.

03. බයිබලය පිළිබඳ හැඳින්වීමක් කොට ක්‍රිස්තියානි දස පණත හා බෞද්ධ පංචශීලය අතර පවත්නා සම විෂමතා පරීක්‍ෂා කරන්න.

04. 'ඉස්ලාම්' යන්නෙහි වචනාර්ථය දක්වා ඉස්ලාම් දහමේ සමාරම්භක පසුබිම පිළිබඳ විමසීමක් කරන්න.

05. දානය පිළිබඳ බෞද්ධ, ක්‍රිස්තියානි සහ ඉස්ලාම් ආගම් තුළ පවත්නා අවදිකම මූලාශ්‍රයානුසාරයෙන් පහදන්න.

### II කොටස

06. ථෙරවාද සම්ප්‍රදායේ ආරම්භය, සංවර්ධනය හා විකාශය පිළිබඳ ප්‍රමාණවත් සටහනක් සපයන්න.

07. පාලි සාහිත්‍යයේ ක්‍රමික සංවර්ධනය, ප්‍රභේදකරණය හා විශේෂතා ගෙනහැර දක්වන්න.

08. සිව්වන ථෙරවාද ධර්ම සංගායනාවේ පසුබිම, අරමුණු හා ප්‍රතිඵල විමර්ශනය කරන්න.

09. 'මහායාන' යන වචනය නිර්වචනය කරමින් එම සම්ප්‍රදායේ ප්‍රභවය පිළිබඳ විද්වත් මත සමාලෝචනය කරන්න.

10. මහායාන චින්තනයේ සංවර්ධනය සඳහා එම සම්ප්‍රදායට අයත් ආචාර්යවරු දෙදෙනෙකුගෙන් ලද දායකත්වය අගයන්න.

********************************